ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2167/6 - 2020 මාර්තු මස 17 වැනි අඟහරුවාදා - 2020.03.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

නිවේදනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 43 (1) වැනි ව්‍යවස්ථාවට හා 46(1)(අ) වැනි ව්‍යවස්ථාවට අනුකූලව මා වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කරමින්, මවිසින් 2019 දෙසැම්බර් මස 10 වැනි දිනැති අංක : 2153/12 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළකරන ලදුව, වරින්වර සංශෝධනය කරන ලද නිවේදනය, වහාම ක්‍රියාත්මක වන පරිදි තවදුරටත් පහත උපලේඛනයේ සඳහන් ලෙස සංශෝධනය කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ගෝඨාභය රාජපක්ෂ,
ජනාධිපති.

2020 මාර්තු මස 13 වැනි දින,
කොළඹ 01,
ජනාධිපති කාර්යාලය.

**උපලේඛනය**

(1) එම නිවේදනයෙහි අංක (1) "ආරක්ෂක අමාත්‍ය" ශීර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි :-

(අ) එහි I වැනි තීරුවෙහි 35 වැනි අයිතමයට පසුව පහත අයිතමයන් එකතු කිරීමෙන් :

36. ආගමන හා විගමන කටයුතු
37. ශ්‍රී ලාංකික පුරවැසිභාවයට අදාළ කටයුතු

(ආ) එහි I වැනි තීරුවෙහි අයිතම 36 සිට නැවත අංකගත කිරීමෙන් ;
(ඇ) එහි II වැනි තීරුවෙහි 31 වැනි අයිතමයට පසුව පහත අයිතමය එකතු කිරීමෙන්;

32. ආගමන හා විගමන දෙපාර්තමේන්තුව

1A - G 31984 — 382 (2020/03)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(ඇ) එහි III වැනි තීරුවෙහි "ශ්‍රී ලංකා ව්‍යසන කළමනාකරණ පනත (2005 අංක 13)" අයිතමයට පසුව පහත අයිතමයන් එකතු කිරීමෙන්;

- ආගාමික හා විගාමික පනත (1948 අංක 20)
- පුරවැසි පනත (1948 අංක 18)
- ඉන්දීය සම්භවයක් ඇති තැනැත්තන්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ පනත (2003 අංක 35)
- අදේශික තැනැත්තන්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ පනත (1986 අංක 5)
- අදේශිකයින්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ (විශේෂ විධිවිධාන) පනත (1988 අංක 39)

(2) එම නිවේදනයෙහි අංක (24) "විදුලිබල හා බලශක්ති අමාත්‍ය" ශීර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි :-

(අ) එහි I වැනි තීරුවෙහි 2 වැනි අයිතමය -

2. "සූර්ය, ජලය, තාපය, ගල්අඟුරු, අපද්‍රව්‍ය සහ සුළං යනාදී මූලාශ්‍රයන් මගින් පුනර්ජනනීය බලශක්ති, විදුලිය සහ අනෙකුත් බලශක්තිය නිපදවීම සම්බන්ධ කටයුතු ගවේෂණය, සැලසුම්කරණය, සංවර්ධනය සහ අධීක්ෂණය" වශයෙන්;

(ආ) එහි I වැනි තීරුවෙහි 4 වැනි අයිතමය -

4. "බලශක්ති කාර්යක්ෂමතාව ඇතිවන පරිදි ඉල්ලුම කළමනාකරණය කිරීම සහ පුනර්ජනනීය විදුලිබල සංවර්ධනය කිරීම" වශයෙන්;

(ඇ) එහි I වැනි තීරුවෙහි 10 වැනි අයිතමයට පසුව පහත අයිතමයන් එකතු කිරීමෙන් ඃ

11. සූර්ය බලශක්ති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම
12. ග්‍රාමීය විද්‍යුතනය
13. විශේෂ ප්‍රමුඛතා ලෙස හඳුනාගත් ද්‍රවීකෘත ස්වභාවික වායු (LNG) විදුලිබල ව්‍යාපෘති, ගල් අඟුරු විදුලිබල ව්‍යාපෘති ඉදිකිරීම් කඩිනමින් ක්‍රියාත්මක කිරීම

(ඈ) එහි I වැනි තීරුවෙහි අයිතම 11 සිට නැවත අංකගත කිරීමෙන් ;

(ඉ) එහි II වැනි තීරුවෙහි 8 වැනි අයිතමයට පසුව පහත අයිතමයන් එකතු කිරීමෙන්;

9. ලංකා විදුලිබල සමාගම
10. සීමාසහිත ලංකා ගල්අඟුරු (පුද්ගලික) සමාගම
11. ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය

(ඊ) එහි III වැනී තීරුවෙහි "ඛනිජ තෙල් සම්පත් සංවර්ධන පනත (2003 අංක 26)" අයිතමයට පසුව පහත සඳහන් අයිතමය එකතු කිරීමෙන් ;

"ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය පනත (2007 අංක 35)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.